# ආණ්ඩු පෙරළීම

විරුද්ධ පක්ෂය  අද වැඩ කරන්නේ එහි එකම කාර්යභාරය ආණ්ඩුව පෙරළීම ලෙස සලකමිනි. විරුද්ධ පක්ෂය කියනු දැත්තේ ආන්ඩුව ජනතාවට දුන් පොරොන්දු ඉටු නොකරන්නේ නම් විපක්ෂයට ආණ්ඩුව පෙරළීම හැරෙන්නට වෙනත් දෙයක් කිරීමට නොහැකි බව ය. දූෂණය ඉහවහා ගොස් ඇති බවත්, බඩු මිළ අහස උසට නැග ඇති බවත් එබැවින් ආණ්ඩුව පෙරලා දැමිය යුතු බවත් විරුද්ධ පක්ෂය කියනු ඇත. විරුද්ධ පක්ෂය කියන කරුණු අසත්‍ය යැයි කිසිවකුටවත් කිවහැකි නො වේ. එහෙත් අද විරුද්ධ පක්ෂය ආණ්ඩුව පෙරළීමට සූදානම්වන්නේ ඒ නිසාම ද?

පත්වන සෑම පාර්ලිමේන්තුවක් පාසාම ඉහළ යන දෑ වන්නේ දූෂණය හා බඩු මිළ ය. දේශපාලනය බොහෝ දෙනාට රැකියාවක් වී ඇති බැවින් දූෂණය පාර්ලිමේන්තුවෙන් පාර්ලිමේන්තුවට, වසරින් වසර ඉහළ යයි. රටේ ඕනෑම තැනක බොහෝවිට කරුණු සිදුවන්නේ මූලධර්ම දෙකක් මත පදනම් වී ය. එනම් බලයට පත්වීම හා බලයේ රැඳී සිටීම ය. රටට හෝ ආයතනයට හෝ වැඩකිරීම හතරවැනි පස්වැනි ගණයේ කරුණක් වෙයි. බොහෝ විට ඒ කරුණ න්‍යාය පත්‍රයෙහි කිසි තැනක නැත. රටට හෝ ආයතනයට හෝ කුමක් වුවත් තම පෞද්ගලික අරමුණු ඉටු කර ගැනීම බොහෝ විට බොහෝ පුද්ගලයන්ගේ න්‍යාය පත්‍රයෙහි අඩංගු එකම කරුණ වෙයි.

විරුද්ධ පක්ෂ උද්ඝෝෂණයේ ප්‍රතිඵලයක් ලෙස එ ජා පක්ෂය බලයට පත්වූ පමණින් දූෂණය හා බඩු මිළ ඉහළ යෑම නවතී යැයි කිව හැක්කේ මෙරට දේශපාලන අතීතය හා එ ජා පක්ෂයේ බොහෝ නායකයන්ගේ හැසිරීම් රටා ගැන කිසිවක් නොදත් අයකුට පමණ ය. එබැවින් ආණ්ඩු පෙරලා දූෂණය හා බඩු මිළ ඉහළ යෑම නවතාදැමීය හැකි යැයි සිතීම මුළාවක් පමණක් වෙයි. එ ජා පක්ෂ නායකයන් කුමක් කීවත් අද ඔවුන්ට ආණ්ඩුව පෙරලා දැමීමට අවශ්‍ය වී ඇත්තේ කොටි සංවිධානයේ පරාජය හැකි අයුරකින් නැවැත්වීමට ය.

ආණ්ඩුව පෙරළීමට වඩාත් අවශ්‍ය වී ඇත්තේ බ්‍රිතානියට ය. මෙරට පමණක් නොව යුරෝපීය නොවන ලෝකය ම නැතිකිරීමට වඩාත්ම කටයුතු කර ඇත්තේ බ්‍රිතානිය ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ලොව පුරා ප්‍රචලිතකිරීමටත්, ඒ බලයෙන් අනෙක් රටවලට පැටවීමටත්, ඒ ලෝකයේ තහවුරුකිරීමටත් වැඩියෙන් ම මැදිහත්වී ඇත්තේ බ්‍රිතානිය ය. බ්‍රිතානිය ඇතැම්විට ඇතැමුන්ට දේශපාලන රැකවරණ ලබාදෙන බව සැබෑ ය. එහෙත් එය ද කෙරෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස ය.

මෙරට ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය ද බ්‍රිතානීන්ගේ නිර්මාණයක් වෙයි. බ්‍රිතානීන් ඒ නිර්මාණය කළේ කුමන්ත්‍රණයක් ලෙස නො වේ. දේශපාලනය ගැන එතරම් අවබෝධයක් නොමැති එහෙත් අතනින් මෙතනින් කරුණු අහුලාගත්තෝ තමන්ට තේරුම් කර දිය නොහැකි සංසිද්ධි සී අයි ඒ කුමන්ත්‍රණ ලෙස හඳුන්වති. යම්කිසි ප්‍රශ්නයකට බටහිරයන් අත පොවන්නේ නම් ඔවුන් එසේ කරන්නේ කෙසේ ද, කිනම් හේතු නිසා දැයි දැක්වීමට අප සමත්විය යුතු ය. එසේ නොමැතිව යමක් බටහිර ආක්‍රමණයක්, කුමන්ත්‍රණයක් යැයි පමණක් පවසා නිහඬවීම හුදෙක් හිතළුවක් ප්‍රකාශකිරීමක් පමණක් වෙයි.

බ්‍රිතානීන් මෙරට ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය නිර්මාණය කෙළේ දහනවවැනි සියවසේ මුල්භාගයේ දී ය. එසේ කළ අන්දම ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා කෘතියෙහි සඳහන් වෙයි. එහෙත් ඇතැමුන්ට එහි ඇමරිකාව ගැන සඳහන් නොවීම ප්‍රශ්නයක් විය. තමන්ට නොතේරෙන දැට සී අයි ඒ කුමන්ත්‍රණ යැයි කීමට පුරුදු වී ඇතියවුන්ට බටහිරයන් ප්‍රශ්නයට මැදිහත්වී ඇති ආකාරය ඒ කෘතියෙහි සඳහන් වී තිබීම තේරුම්ගත නොහැකි විය. බ්‍රිතානීන්ට පෙර ලන්දේසීහු දුම්කොළ වගාව සඳහා යාපනයට දකුණු ඉන්දියාවෙන් ජනයා ගෙන ඒමෙන් ප්‍රශ්නයට පසුබිම සකස් කළහ. ඒ කෙසේ වෙතත් බ්‍රිතානි මැදිහත්වීම දිගින් දිගට කියද්දීත් ඇතැම් අය ඒ විශ්වාසකිරීමට අකමැතිවූහ. ඔවුන් බොහෝවිට සෙවූයේ ඇමරිකාවේ හෙවත් අංකල් සෑම්ගේ අත ය. ප්‍රශ්නයට නෝර්වේ රාජ්‍යය මැදිහත්වූ විට ඇතැමුන්ට එය ඒ රටෙහි පමණක් මැදිහත්වීමක් විය. ඔවුන් ඒ මැදිහත්වීම තේරුම් ගත්තේ එරට වසන දෙමළ ජනයා සතුටු කිරීමට ඒ රාජ්‍යය දරණ උත්සාහයක් ලෙස ය. ඒ කිසිම රටක කිසිම දෙමළ ජනවාර්ගිකයකු නැතිවුව ද මේ රටවල් ප්‍රශ්නයට මැදිහත්වීමට නියමිත ව තිබුණි.

© Prof. Nalin De Silva

විවිධ අවස්ථාවල බ්‍රිතානි පාර්ලිමේන්තුවේ ලංකාවේ ඇතැයි කියන ජනවාර්ගික ප්‍රශ්නය සාකච්ඡාකළ විට ද බොහෝ දෙනා එය දුටුවේ එරට සිටින, විශේෂයෙන් ම ලංඩනයේ ටූටින් වැනි ප්‍රදේශවල සංකේන්ද්‍රගත ව සිටින දෙමළ ජනයාගේ ඡන්දය ලබාගැනීමට එරට දේශපාලන පක්ෂ, ප්‍රධාන වශයෙන් කම්කරු පක්ෂය දැරූ උත්සාහ ලෙස ය. පාර්ලිමේන්තු සෙල්ලමේ එක් අංගයක් වනුයේ ඡන්දය ලබාගැනීම බව සැබෑ ය. එහෙත් බ්‍රිතානි දේශපාලන පක්ෂවත් නොර්වේ රාජ්‍යයෙහි දේශපාලන පක්ෂවත් මේ ප්‍රශ්නයට මැදිහත්වන්නේ ඒ නිසා පමණක් නො වේ. ඡන්දය ලබාගැනීම ඉතා සුළු කරුණක් පමණක් වෙයි.

තවත් අයට බටහිරයන් මේ ප්‍රශ්නයට මැදිහත්වන්නේ ඔවුන්ගේ නොදැනුවත්කම නිසා ය. දෙමළ ජාතිවාදීන් ඒ රටවල කර ඇති ප්‍රචාරයන්ට මුළා වී ඒ දේශපාලනඥයන් දෙමළ ජනයාට පක්ෂව ක්‍රියාකරන්නේ යැයි ඔවුහු විශ්වාස කරති. විශේෂයෙන් ම බටහිර රටවල වෙසෙන සිංහලයෝ ඒ විශ්වාසය ඇතිකර ගැනීමට කැමති වෙති. ඔවුන්ට අනුව අප කළ යුත්තේ ප්‍රශ්නය ගැන බටහිර දේශපාලනඥයන් දැනුවත් කිරීම ය. බටහිර දේශපාලනඥයන් දැනුවත්කිරීමට උත්සාහ කිරීමේ වරදක් නැත. එහෙත් ඔවුන් දැනුවත්වීම ප්‍රතික්ෂෙප කරනු ඇත. දේශපාලනය තබා භෞතික විද්‍යාවවත් හුදු දැනුවත්වීම්වලට සීමා නො වේ. අප දැනුවත්වන්නේ අපට අවශ්‍ය ආකාරයට ය. අපි අපට අවශ්‍ය දෑ විශ්වාස කරමු. බටහිර රටවල වාසයකරන සිංහලයන්ට තම ඊනියා හෘදයසාක්ෂිය පිනවිය හැක්කේ ඒ රටවල දේශපාලනඥයන්ගේ නොදැනුවත්කම් ගැන විශ්වාසකිරීමෙනි.

ඒ රටවල දේශපාලන ව්‍යාපෘති ප්‍රශ්නකිරීම බටහිර රටවල වාසය කරන සිංහලයන්ගේ හිත සුව පිණිස නො වෙයි. ඒ සිංහලයන් පමණක් නොව මෙරට ඊනියා උසස් අධ්‍යාපනයක් ලැබූවන්ගෙන් බොහෝ දෙනා ද බටහිර රටවල දේශපාලන ව්‍යාපෘතිය වෙනුවෙන් වක්‍රව හෝ පෙනී සිටිති. බටහිර රටවල ප්‍රධාන දේශපාලන ව්‍යාපෘතිය ලෝකයේ අනෙක් රටවල බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ප්‍රචලිතකිරීම, එය තහවුරු කිරීම හා එය අනෙක් රටවලට වංචාවෙන්, බලයෙන් හෝ වෙනත් ආකාරයකින් පැටවීම ය. බ්‍රිතානීහු රාජ්‍ය තාන්ත්‍රිකව සූක්ෂම ව  එසේ කිරීමේ අති දක්ෂයෝ වෙති. ඇමරිකාව එහි දී අනුගමනය කරන්නේ ගොරහැඩි ප්‍රතිපත්තියකි.

මෙරට ප්‍රශ්නයට නොර්වේ මැදිහත් වූයේ එරටට ලංකාවෙන් ගොස් සිටින දෙමළ ධීවරයන්ගේ ප්‍රශ්නයක් නිසා නොව බ්‍රිතානියේ අවශ්‍යතාව නිසා ය. මුල දී බ්‍රිතානියේ උපක්‍රමය වූයේ තමන් පසුපස සිට නෝර්වේ ඉදිරියට දමා ප්‍රශ්නයට මැදිහත් වීමට ය. එහෙත් නෝර්වේ අද අසමත් මැදිහත්කරුවකු බවට පත් වී ඇත. බටහිරයන්ට අසමත් රාජ්‍ය ඇතත් අසමත් මැදිහත්කරුවෝ නො වෙති. අපට නම් ඇත්තේ අසමත් මැදිහත් කරුවන් ය; අසමත් ව්‍යාපෘති ප්‍රචාරකයන් ය. නෝර්වේ අසමත්වීමෙන් පසුව බ්‍රිතානියට සෘජුව ම මැදිහත් වීමට සිදු වී ඇත.

අද බ්‍රිතානිය විවිධ ව්‍යාපෘති වෙනුවෙන් පවුම් කෝටි ගණනින් වියදම් කරයි. විවිධ රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ මේ මුදල් සැපයේ. සාමය හා ගැටුම් නිරාකරණය මේ ව්‍යාපෘතිවල ප්‍රකාශිත අරමුණ වුවත් යටි අරමුණ වන්නේ ලංකාවේ හමුදාව දුර්මුඛ කිරීම, අධෛර්යමත් කිරීම හා ඔවුන්ට තම රට වෙනුවෙන් සටන් කිරීම එපා කරවීම ය. අද බ්‍රිතානියට අවශ්‍ය කෙසේ හෝ කොටි සංවිධානය ආරක්ෂාකිරීමත් ඔවුන් ඔස්සේ සිංහලත්වය නැතිකිරීමත් ය. ඒ අද බටහිර දේශපාලන ව්‍යාපෘතියේ කොටසක් වෙයි.

බ්‍රිතානිය සිංහලත්වය නැතිකිරීම සඳහා යොදාගන්නා තවත් පක්ෂයක් නම් එ ජා පක්ෂය ය. ඒ පක්ෂය අද ආණ්ඩුව පෙරළීමට කතාකරන්නේ දූෂණය නැතිකිරීමටවත් බඩුමිල පහළ දැමීමටවත් නො වෙයි. ඔවුන්ට ඒ කළ නොහැකි බව බ්‍රිතානි මහා කොමසාරිස් ද හොඳාකාරව ම දනියි. එහෙත් ආණ්ඩුව පෙරලා බලයට පත්වුවහොත් එ ජා පක්ෂයට කළ හැක්කක් වෙයි. ඒ කොටි සංවිධානය ආරක්ෂාකරීම ය. ඒ බව ද අදාළ මහා කොමසාරිස්වරයා දනියි. සිංහලත්වය නැතිකිරීම සඳහා පිහිටුවාගෙන ඇති විද්‍යුත් මෙන් ම මුද්‍රිත ජනමාධ්‍ය සියල්ලෙහි නොමසුරු ආධාරය මේ අවස්ථාවෙහි එ ජා පක්ෂයට ලැබෙයි. රාජ්‍ය නොවන සංවිධාන ද එ ජා පක්ෂය හා කොටි සංවිධානය වෙනුවෙන් අතිකාල සේවයෙහි යෙදෙයි. අද ආණ්ඩු පෙරළීමට කතාකරන්නේ අප වෙනුවෙන් නොව බ්‍රිතානීන් වෙනුවෙනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva